සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්ම දේශනාව සිදු කිරීම පිණිස වැඩම කළේ,
   1. බරණැස ඉසිපතනාරාමයට ය.
   2. සැවැත්නුවර ජේතවනාරාමයට ය.
   3. කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයට ය.
   4. කොසඹෑනුවර ඝෝෂිතාරාමයට ය.

02. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කරවාගෙන එන ලෙස සුදොවුන් රජතුමා පැවරුවේ,
   1. සුනීධ ඇමතිවරයාට ය.
   2. කාළුදායි ඇමතිවරයාට ය.
   3. වස්සකාර ඇමතිවරයාට ය.
   4. සීහ ඇමතිවරයාට ය.

03. පස්වග මහණුන් වහන්සේලා රහත් වූයේ,
   1. රතන සූත්‍රය ඇසීමෙනි.
   2. දම්සක් පැවතුම් සූත්‍රය ඇසීමෙනි.
   3. අනත්ත ලක්ඛණ සූත්‍රය ඇසීමෙනි.
   4. කරණීයමෙත්ත සූත්‍රය ඇසීමෙනි.

04. ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ,
   1. පංච සීලය යි.
   2. අට සීලය යි.
   3. ආජීව අෂ්ටමක සීලය යි.
   4. දස සීලය යි.

05. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ බුදු දහම රැගෙන ලංකාවට වැඩම කළේ,
   1. වෙසක් පොහොය දිනක ය.
   2. පොසොන් පොහොය දිනක ය.
   3. ඇසළ පොහොය දිනක ය.
   4. උඳුවප් පොහොය දිනක ය.

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

06. බුදු සසුනේ ද්වේවාචික උපාසකවරුන් වූයේ තපස්සු හා භල්ලුක දෙදෙනා ය. ( )
07. මෛත්‍රී වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග ගණනාවක් කරණීයමෙත්ත සූත්‍රයෙහි ඇතුළත් වේ. ( )
08. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා සිරිත් විරිත් විස්තර කරමින් 'සිරිත් මල්දම' කෘතිය රචනා කළේ ය. ( )
09. අපණ්ණක ජාතකයේ සාත්තු නායකයා ව ඉපදී සිටියේ දෙව්දත් තෙරුන් වහන්සේ ය. ( )
10. "අග්‍රශස්‍ය දානය" යනු අලුත් බත් දානය යන්නට යෙදෙන තවත් නමකි. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

11. .................................... විදේශීය ආක්‍රමණ සිදුවූ අවස්ථාවල දී ලාංකිකයන් වෙනුවෙන් නායකත්වය ගෙන ක්‍රියා කළේ ය.
12. හේමන්ත, ගිම්හාන හා වස්සාන යනු ............................................ තුනකි.
13. .................................. මානසික රෝගවලට පිළියම් කළ වෛද්‍යවරයෙකි.
14. තමා උපමාවට ගෙන අන්‍යයන්ට හිංසා පීඩා නොකිරීම ............................................ ලෙස හැඳින්වේ.
15. සිංහල ජනතාව ඉතා විනීත වූ පිරිසක් බව .................................. තම කෘතිය තුළ විස්තර කළේ ය.

(රොබට් නොක්ස්, ඍතු, අත්තූපනායක ධර්ම පර්යාය, අනගාරික ධර්මපාලතුමා, වාරියපොළ ශ්‍රී සුමංගල නාහිමි, සහජීවනය, බුදුරජාණන් වහන්සේ, ත්‍රිවිධ චෛත්‍යය)

- අංක 16 සිට 20 තෙක් **A** කොටසට ගැළපෙන පිළිතුර **B** කොටසින් තෝරා යා කරන්න.

| **A** | **B** |
|---|---|
| 16. අනිමිස ලෝචන පූජාව | ධම්ම සේනාධිපති |
| 17. ගිරිමානන්ද සූත්‍රය | මව්පිය උපස්ථානය |
| 18. සැරියුත් මහරහතන් වහන්සේ | දහලොස් පින් කිරියවත් |
| 19. සාලිකේදාර ජාතකය | රෝග හටගන්නා ක්‍රම |
| 20. කාව්‍යශේඛරය | ජය ශ්‍රී මහා බෝධිය |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01. තෙවන වාරයේ බුද්ධ ධර්මය විෂයට සමගාමී ව ඔබ විසින් සිදුකරන ලද ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
   1. මෙම ඇගයීමට අදාළ ව ඔබ යොදාගත් පාඩමේ නම කුමක් ද?
   2. එම පාඩමට අදාළව සිදු කළ ක්‍රියාකාරකම කුමක් ද?
   3. එම ඇගයීම සිදුකිරීමට පෙර ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
   4. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබේ කණ්ඩායම මුහුණදුන් එක් ගැටලුවක් ලියන්න.
   5. මෙම ඇගයීම සිදු කිරීමෙන් ඔබ සංවර්ධනය කරගත් කුසලතා දෙකක් ලියන්න.
   6. බුදුරජාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව සඳහන් වන සූත්‍රය කුමක් ද?
   7. චතුරාර්ය සත්‍ය අතරින් දෙකක් ලියන්න.
   8. ත්‍රිවිධ තෘෂ්ණාවෙන් දෙකක් නම් කරන්න.
   9. කාමසුඛල්ලිකානුයෝගය යන්නෙහි අර්ථය ලියන්න.
   10. ආර්ය අෂ්ටාංගික මාර්ගාංගවලින් දෙකක් ලියන්න. (ලකුණු 2 × 10 = 20)

02. 1. අක්කොච්ඡි මං අවධි මං
   ......................................
   ......................................
   වේරං තේසූපසම්මති... යන ගාථාව සම්පූර්ණ කරන්න.
   2. එම ගාථාවේ තේරුම ලියන්න.
   3. ඉවසීමෙන් හා මෛත්‍රියෙන් යුතුව කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.
   (ලකුණු 2+3+5 =10)

03. 1. බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව නම් කරන්න.
   2. ඉන් එක් අයෙකුගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.
   3. එම දෙදෙනාගෙන් එක් අයෙකු පිළිබඳ ව විස්තර කරන්න. (ලකුණු 2+3+5 =10)

04. 1. ගුරු - සිසු සබඳතාව පෙන්වා දෙමින් දේශනා කොට වදාළ සූත්‍රය නම් කරන්න.
   2. එම සූත්‍රයෙහි සඳහන් ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න.
   3. යහපත් ශිෂ්‍යයෙකු ලෙස ඔබ ගුරුවරයා කෙරෙහි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව වාක්‍ය පහක් ලියන්න.
   (ලකුණු 2+3+5 =10)

05. 1. 'සහජීවනය' යනු කුමක්දැයි හඳුන්වන්න.
   2. "පින් මද පුතුන් සියයක් ලදුවත් නිසරු..." යන කවිය සම්පූර්ණ කරන්න.
   3. සහජීවනයෙන් යුතු සමාජයක් ගොඩනැගීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් ලියන්න.
   (ලකුණු 2+3+5 =10)

06. 1. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙහි ප්‍රකට වන විශිෂ්ට ගුණාංග මාලාවක් ප්‍රකාශ කළ රාජ පූජිත බමුණාගේ නම කුමක් ද?
   2. යහපත් වචන කතා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල තුනක් ලියන්න.
   3. නිදා ගන්නවා, අතු ගානවා, අනුභව කරනවා, කියනවා, වතුර නානවා යන වචනවලට භාවිත කරන ශාසනික වචන ලියා දක්වන්න. (ලකුණු 2+3+5 =10)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න. (ලකුණු 5+5 =10)
   1. අරහං බුදු ගුණය 2. ගිලානෝපස්ථානය 3. ආගන්තුක සත්කාරය 4. මෛත්‍රී භාවනාව